**මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය - 2015**

**------------------------------------------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වන වගන්තිය මගින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය හඳුනාගැනීමේදී සිදුවූ දෝෂ හේතුවෙන් පිරිවැය රු.47,450,180 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදාන යටතේ මිලදී ගන්නා වත්කම්වල ක්ෂය කිරීම සම්බන්ධව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම් මගින් අනාවරණය කර නොතිබූ අතර 2011 සහ 2012 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.7,250,000 ක ශුද්ධ අගය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,901,167 ක් දක්වා අඩුවී තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය උපලේඛනය සමඟ සැසඳීමේදී රු.891,200 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව දිගුකාලීන ආයෝජනවල වටිනාකම රු.14,335,190 ක් වුවද, ඉදිරිපත් කර ඇති විස්තරාත්මක සටහන්වල වටිනාකම රු. 14,164,403 ක් ලෙස දැක්වීම නිසා රු. 170,787 වෙනසක් විය.

### 2.3 ලැබිය යුතු ගිණුම්

ගිවිසුම් කඩකළ නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.3,481,830 ක මුදල අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමේ එකඟතාවය පළකර තිබුණද, 2015 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අය කර ගෙන නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | |
| XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.64,883,895 ක පාරිශ්‍රමික ගෙවා තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XXIV පරිච්ඡේදයේ 4.2.5 උපවගන්තිය | 2012 මැයි මාසයේදී සේවයෙන් ඉල්ලා අස් වූ නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.38,080 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අය කර ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.3,754,212ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.682,036 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඌනතාවය රු.3,072,176 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.14,420,000 කින් වැඩිවී තිබුණද පුද්ගලික පාරිශ්‍රමිකය රු.19,313,843 කින් වැඩිවීම ඌනතාවය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂ 05 තුළ මූල්‍ය ප්‍රතිඵල සලකා බැලීමේදී 2012,2014 හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රාජ්‍ය බදු සඳහා ගැලපීම් කිරීමෙන් පසු දායකත්වයේ වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.11,152,226 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව නියම කරනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය විශ්ව විද්‍යාලයකින් ආවරණය කරන අතර තාක්ෂණික ආයතනය පීඨ හතරකින් සමන්විතව තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1220 ක් විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් වසරේ පවත්වන ලද විභාග ප්‍රතිඵල අනුව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 430 ක් වන අතර ඉන් සිසුන් 296 ක් එනම් සියයට 69ක් විභාගය සමත්ව තිබූ අතර සිසුන් 134 ක් එනම් සියයට 31 ක් විභාගය අසමත් වී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ එක් එක් අධ්‍යයනාංශවල සිසුන් පළමු වසර විභාගය සියයට 85 ක් සමත් වෙතැයි අපේක්ෂා කළද සමත්ව තිබූ ප්‍රතිශතය සියයට 62 ත් සියයට 74 ත් අතර වූ බැවින් අපේක්ෂිත ඉලක්ක ඉටු වී නොතිබුණි.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණ ආයතන සංවර්ධන අරමුදල් දෙකෙහි වටිනාකම වන රු.693,002 ක් කිසිදු කාර්යයකට නොයොදා වසර 10 ක පමණ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තාක්ෂණ ආයතනයේ විගණන කටයුතු මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකගේ සුපරීක්ෂණය යටතේ තාක්ෂණ ආයතනයෙන් අනුයුක්ත කරන ලද එක් ලිපිකරුවෙකු මගින් ඉටුකරනු ලැබේ.මෙය අභ්‍යන්තර විගණන අංශයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමවල ප්‍රගතිය නිශ්චය කිරීම, ව්‍යාපෘති සම්බන්ධව ගැටලු ක්ෂේත්‍රයන් සලකා බැලීම්, ස්ථානීය පරීක්ෂා කිරීම් සිදු කිරීම යනාදිය අභ්‍යන්තර විගණන අංශයෙන් ආවරණය වී නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු. 4,000,000 ක උපකරණ අයිතමයන් 18 ක් සහ රු. 500,000 ක් වටිනා පොත් තොගයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | වත්කම් සාධාරණ අගයන්ට ගිණුම්වල හෙළිදරව් නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | ගිවිසුම් කඩකල නිලධාරීන්ට එරෙහිව කඩිනමින් ක්‍රියා නොකිරීම හා පවත්නා නීතිරීති වලට අනුව කටයුතු නොකිරීම.<br><br>ණය අයකිරීම් විධිමත් කර කඩිනමින් අය කිරීමට කටයුතු නොකිරීම. |